# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2053/21 - 2018 ජනවාරි මස 10 වැනි බදාදා - 2018.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 01/2018 දරන සුරාබදු නිවේදනය

**සුරාබදු බලපත්‍ර ස්ථාන විවෘත කරනු ලබන හා වසනු ලබන වේලාවන්**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 32 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මඟින් පහත උපලේඛනයෙහි දක්වෙන සුරාබදු බලපත්‍ර ස්ථාන විවෘත කරනු ලබන හා වසනු ලබන වේලාවන් 2018.01.11 වැනි දින සිට බලාත්මක වේ.

1980 මැයි 14 දිනැති අංක 88/7 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 675 දරන සුරාබදු නිවේදනය මෙයින් පරිච්ඡින්න කරමි.

මංගල සමරවීර,<br>
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 ජනවාරි මස 09 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|---|
| | *බලපත්‍ර වර්ගය* | *විවෘතව තැබිය යුතු වේලාවන්* |
| 1. | විදේශ මත්පැන් තැබෑරුම් | පෙ. ව. 11.00 - ප. ව. 10.00 |
| 2. | රා තැබෑරුම් | පෙ. ව. 11.00 - ප. ව. 09.00 |
| 3. | හෝටල් බලපත්‍ර (ර. බී. 07) සංචාරක මණ්ඩල අනුමැතිය රහිත | පෙ. ව. 11.00 - ප. ව. 10.00 |
| 4. | හෝටල් පීධිකා බලපත්‍ර (ර. බී. 08) සංචාරක මණ්ඩල අනුමැතිය රහිත | පෙ. ව. 11.00 - ප. ව. 10.00 |
| 5. | හෝටල් බලපත්‍ර (ර. බී. 07) සංචාරක මණ්ඩල අනුමැතිය සහිත | පෙ. ව. 11.00 - මධ්‍යම රාත්‍රී 12.00 (අවශ්‍ය වන්නේ නම් බලපත්‍රකරුගේ ඉල්ලීම මත අළුයම 02.00 දක්වා අතිරේක බලපත්‍ර වල වේලාව දීර්ඝ කිරීමට ක්‍රියා කරනු ඇත) |
| 6. | හෝටල් පීධිකා බලපත්‍ර (ර. බී. 08) සංචාරක මණ්ඩල අනුමැතිය සහිත | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* |
|---|---|---|
| *බලපත්‍ර වර්ගය* | | *විවෘතව තැබිය යුතු වේලාවන්* |
| 7. | සිනමා ශාලා බලපත්‍ර (ර. බී. 09) | පෙ. ව. 11.00 - ප. ව. 10.00 (දර්ශන පෙන්වන අවස්ථාවල දී පමණි) |
| 8. | ආපනශාලා බලපත්‍ර (ර. බී. 11) සංචාරක මණ්ඩල අනුමැතිය රහිත | පෙ. ව. 11.00 - ප. ව. 10.00 |
| 9. | ආපනශාලා බලපත්‍ර (ර. බී. 11) සංචාරක මණ්ඩල අනුමැතිය සහිත | පෙ. ව. 11.00 - ප. ව. 11.00 |
| 10. | පරිශ්‍රය තුළ දී පරිභෝජනය කරන බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් බලපත්‍ර (ර. බී. 22 බී) (සංචාරක මණ්ඩල අනුමැතිය රහිත පරිශ්‍රයන් සඳහා) | පෙ. ව. 11.00 - ප. ව. 10.00 |
| 11. | පරිශ්‍රය තුළ දී පරිභෝජනය කරන බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් බලපත්‍ර (ර. බී. 22 බී) (සංචාරක මණ්ඩල අනුමැතිය සහිත පරිශ්‍රයන් සඳහා) | පෙ. ව. 11.00 - ප. ව. 11.00 |
| 12. | තානායම් බලපත්‍ර (ර. බී. 12) | පෙ. ව. 11.00 - ප. ව. 11.00 |
| 13. | දුම්රිය ආපනශාලා බලපත්‍ර (ර. බී. 10) | පෙ. ව. 11.00 - ප. ව. 10.00 |
| 14. | සමාජ ශාලා බලපත්‍ර (ර. බී. 13 ඒ) (සාමාජිකයින් සඳහා පමණයි) | පෙ. ව. 11.00 - ප. ව. 10.00 |
| 15. | හිමිකාර සමාජශාලා බලපත්‍ර (ර. බී. 13) | පෙ. ව. 11.00 - ප. ව. 10.00 |
| 16. | මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර (ර. බී. 04, AFL 04) | පෙ. ව. 08.00 - ප. ව. 10.00 |
| 17. | බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් සිල්ලරට විකිණීමේ බලපත්‍ර (ර. බී. 22 ඒ) | පෙ. ව. 08.00 - ප. ව. 10.00 |

01 - 702

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.